# නවකතාවට ගැමි සුවඳක්






සිසිර දිසානායක

> ළමා සිත්හි නිරන්තරයෙන් පිරී පවතින කුහුල අවුලවාලමින් ලියැවුණු ''මඩොල් දූව' හෙළයේ මහා ගත්කරු වශයෙන් හැඳින්වෙන මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ විශිෂ්ඨතම ළමා නවකතාව ලෙසින් නම් කළ හැකිය.

''යමුද නිකං ඉන්න එකේ අර පොත් ප්‍රදර්ශනය පැත්තේ?'' පන්හිඳ පින්සලට යෝජනාවක් ගෙනාවා.
(''මොන?'' පින් මොකුත්ම දන්නේ නැතිවා වාගේ.
''ඇයි අර ''ස්පර්'' සංගමයෙන් පවත්වන ''ගොඩගේ'' පොත් ප්‍රදර්ශනයට.)
''යංකො එහෙනං'' දෙන්නම කලිසංවලට බැස්සා.
''බයිසිකලෙං යං, ඇඟටත් හොඳයිනෙ.'' පින් යෝජනා කළා.
''ඔව් පදින එක්කෙනාට නං හොඳා'' පන් කිව්වේ නොරිස්සුමෙන් වගේ.

''ඇයි එහෙම කියන්නේ'' පින් ඇහුවා.
''ඇයි මතක නැද්ද එක බයිසිකලයක් ගිය සතියේ ගරාජ් සේල් එකට දැම්මා.''
''හැබෑ නේන්නං. ඩබල් දාලා යං''
පන් පින්වත් තියාගෙන ''ඩැංඩි නොංග්'' දිහාවට පදින්න ගත්තා.
''හෝල්ට්'' ඒ ට්‍රැෆික් රාළහාමි කෙනෙක්ෟ
''හෝව්ෟ හෝව්ෟෟ හෝව්ෟෟෟ ''
පන් බොහෝම අමාරුවෙන් කකුල් දෙක බිම අතුල්ලාගෙන ගිහින් බයිසිකලේ නවත්වා ගන්න උත්සාහ කළා. බාටා රබර් සෙරෙප්පු දෙකට පින්සිද්ධ වෙන්න යාර දහයක් විතර ගිහින් බයිසිකලේ නැවතුණා.

''මෙහාට එනවා. මෙහාට එනවා''
රාළහාමි දුර ඉඳන් අතින් සන් කළා.
''බ්‍රේක් නෑ නේද?''
'නෑ රාළහාමි''
''දන්නේ නැද්ද මේක ''වන් වේ'' කියලා.''
''නෑ රාළහාමි''
''කෝ ලයිෂන් එක?''
''ඒ කිව්වේ'' අර තහඩු කෑල්ලද?'' ගරාජ් සේල් දමපු බයිසිකලේ නං එහෙම එකක් තිබුණ වග පන්ට මතක් වුණා.
''කෝ මේකේ ලයිට් එහෙම''
''ඩයිනමෝව ලෙඩ දුන්න හන්දා ඒකත් ගලවලා දැම්මා රාළහාමි''
''එතකොට ලෙඩ හොඳ වුණාද?'' රාළහාමි තවත් සැර වුණා.
''තමුසෙලාට දෙන්න දඩුවම් නෑ අයිසෙ. අරිනවා ටයර්වල හුළං''
''පින් හුළං අරින්න වෑල්ව් එක ඇරියා.
''හුළනුත් නෑ රාළහාමිෟ''

''ඩබලුත් දාගෙන රිව් එකෙය එහෙනං දෙන්නා ඇවිත් තියෙන්නේ. යනවා යනවා ඔය දැර හැවත් අරගෙන මට නොපෙනී.''
දෙන්න එක්ක ප්‍රදර්ශන ශාලාවට ළංවෙන කොට ඉවර වෙන්නත් ළංවෙලා. ''හොඳ පොත් ටිකක් තියෙනවා'' පන් පොත් අතරේ නොපෙනී ගියා. පොත්වල ලියැවිලා තියෙන දේ ගැන වැඩි උනන්දුවක් නැති පින් උඩින් පල්ලෙන් එහෙන් මෙහෙන් පොත්වල කවර බල බලා හීන් සැරේ පුස්තකාලයට රිංගා ගත්තේ ඒකේ මොනවද තියෙන්නේ බලන්න.
පොත් කියවන්න තමන්ට රුචියක් ඇතිවුණ හැටි පන්ට පොත් තෝරන අතරේ මතක් වුණා.

''සැබැවින්ම පොතපත කියවීමේ රුචිය ඇතිවිය යුත්තේ ළමාවියේදීමය. දෙමව්පියන්ගෙන් ඊට ලැබෙන අනුබලය මෙහිදී ඉතාමත්ව වැදගත් වේ. තමන්ගේ දරුවා වෙනුවෙන් පොතක් තෝරා ගැනීමේදී තමා තමුන්ගේ ළමා වියට යාම නිතැතින්ම සිදුවන්නක්. තමාගේ ළමා වියේදී තමා කියැවීමට වඩාත් රුචි වූ පොතපත තම දරුවන් වෙනුවෙන් සොයා ගෙනැවිත් දීමට බොහෝ වැඩිහිටියන් උනන්දු වන බව නොරහසකි. එහෙත් තමාගේ දරුවා අද දින ළමාවිය ගත කරන්නේ තමාට වඩා සෑම අතින්ම වෙනස් වූ පරිසරයක බැව් සිහිතබා ගත යුතුවන වැදගත්ම කරුණ වෙයි.'' පන්ගේ සිතුවිලි පෙළ ගැහෙන්න වුණා. පන්ට මුලින්ම කියවන්න ලැබුණේ ටී.බී. ඉලංගරත්නයන්ගේ ''අඹයාළුවෝ'' ළමා නවකතාව

මහනුවර හතරලියැද්ද ප්‍රදේශයේ උපත



ලැබූ ටී.බී. ඉලංගරත්නයන්ගේ නවකතා තුළ එම ප්‍රදේශයේ ගැමි වහර අපූරුවට යොදාගෙන තිබීම විශේෂ ලක්‍ෂණයක් ලෙසින් දැක්වීමට හැකියි. වහර තුළින් ගැමි සුවඳ ළමා මනසට ළං කරවීමෙහිලා ඉලංගරත්නයන් දැක්වූයේ කිසිවෙකුට නොදෙවෙනි වූ කුසලතාවයකි. මිනිස්කම, සමානාත්මතාවය වැනි හර පද්ධතීන් චමත්කාරය සමඟින් මුහුකොට ළමා චිත්ත සන්තානයට පෙවීමේදී තමන්ගේම අත්දැකීම් ඊට උපයෝගී කරගත් බැව් ''විලම්බීත'', ''තිලක' හා ''තිලක හා තිලකා'' තුන් ඈඳුතු නවකතා පෙළින් තහවුරු වේ.

ඉලංගරත්නයන්ගේ අනෙකුත් ළමා නවකතා අතර ''ශිෂ්‍යත්වය'', ''පියාදරය'' සහ ''හපනා'' මුල් තැනක් ගන්නා අතර ළමා කතා වශයෙන් ''පිස්සු ලූසී'' ''අළුත් මල්ලී'' සහ ''නිමලාගේ උපන් දවස'' ළමා සිත් ඇද බැඳ ගැනීමෙහිලා සමත් විණ.

ළමා සිත්හි නිරන්තරයෙන් පිරී පවතින කුහුල අවුලවාලමින් ලියැවුණු ''මඩොල් දූව' හෙළයේ මහා ගත්කරු වශයෙන් හැඳින්වෙන මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ විශිෂ්ඨතම ළමා නවකතාව ලෙසින් නම් කළ හැකිය. තම නිජ බිම් ප්‍රදේශය වූ කොථාගල පරිසරයම සිය පාසැල කර ගනිමින් මුළුමහත් විශ්වයම විමසා බලන්නට සිය ඥාණ මණ්ඩලය විහිදුවා ලූ පඬිවරයාණ කෙනෙකි වික්‍රමසිංහයන්. ළමා නව කතාවක් නොවූවද තම ළමාවිය ආවර්ජනාත්මකව පෙළ ගැන්වූ ''අපේ ගම'' කෘතිය ''මඩොල් දූව'' කියවා චිත්ත රූප නැංවීමට හුරුවූවකු අතින් අනායාසයෙන්ම තෝරා ගැනෙන්නෙකි. ''උපන් දා සිට'' සහ ''කළුනික'' ඊටම පෙළ ගැන්වේ. හෙළ ප්‍රෞඩ ඉතිහාසයේ නෂ්ඨාවශේෂයන් ස්පර්ශ කරමින් පාඨකයා ඒ වෙත යොමු කරවීම ''කළුනික සෙවීම'' කෘතියෙහි ඇති වැදගත්ම ලක්‍ෂණයකි. ''ගම්පෙරළිය'', ''කලියුගය'' හා ''යුගාන්තය'' තුන් ඈඳුතු නවකතාව මුල් කොටගත් ''විරාගය'', ''රෝහිණී'', ''බවතරණය'' වැනි නවකතාවන් ද, ''පව් කාරයාට ගල් ගැසීම'', ''අපේ විත්ති'', ''වහල්ලු'', ''හඳ සාක්කි කීම'' වැනි කෙටි කතා පොත් පෙළද වික්‍රමසියන්ගේ කෘතීන් අතර සාමාන්‍ය පාඨකයන්ගේ රසඥතාවය සහ පරිකල්පන ශක්තිය නැංවීමෙහි ලා පූරෝගාමී විය.

''රෝහිණී'' ඓතිහාසික පසුබිමකින් පාඨක මනෝභාවයන් නංවන අතර, ''බවතරණය'' බුදු සිරිත ඇසුරින් නව චින්තන රටාවක් පාඨකයාට ඉදිරිපත් කරයි.
ගැමි පරිසරය ඇසුරින් නවකතා කරණයේ පුරෝගාමී වූවන් අතර, ගම්පහ දිස්ත්‍රික්කෙයි රදාවානේ මහගම සේකර, කේ. ජයතිලක, මිනුවන්ගොඩ මඩවල එස්. රත්නායක, පන්නිපිටියේ ඇරැව්වල නන්දිමිත්‍ර, හොරණ ප්‍රදේශයේ පොකුණුවිට කරුණාසේන ජයලත්, අවිස්සාවේල්ල ගුරුගල්ලේ සෝමවීර සේනානායක, අනුරාධපුර නවගත්තේගම, සයිමන් නවගත්තේගම, හොරණ ජයශේකර ජයකොඩි, මාතලේ පියදාස වැලිකන්නගේ, අනුරාධපුර ශාන්ති දිසානායක, රත්නපුර සුනේත්‍රා රාජකරුණානායක වැනි ගත් කතුවරයින් සහ ගත්කතුවරියන් සිහිපත් කළ හැකියි.
පේරාදෙණිය සරසවිය ඇසුරින් සිය නවකතා කලාවන් පෝෂණය කරගත් විද්වතුන් අතරින් ගුණදාස අමරසේකර, සිරි ගුණසිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර වැනි ප්‍රඥයින්ද මෙහිලා සඳහන් කළ යුතු වේ.''

පන් පොත් ටිකක් තෝරාගෙන එළියට එන කොට පින් බයිසිකලයට හුළං ගහගෙන ඇවිත් හිටියා. ග්‍රිස්මෙට කන්නත් එකක් අයිස් ක්‍රීම් පෙට්ටියකුත් අරගෙනයි දෙන්නා ගෙට ගොඩවුණේ.

''කෝ බලන්න අර ඊයේ ගෙනාව පොත් මොනවාද කියලා?''
පින් පහුවදා පන්ගෙන් ඇහුගේ ඒ ගැන බලන්නවත් බැරි වුණ හින්දයි.
''පොත් රාක්කේ ඇති..,'' පන් කොහෙදෝ ඉඳන් කිව්වා.
''මළා ජුවානිස්ෟ'' රාක්කෙ පුරාම වතුර පෙරෙනවා. පොත් රාක්කේ උඩ අයිස්ක්‍රීම් පෙට්ටිය.
''කෝ එතකොට පොත්ටික''
''ෆ්‍රවර් එකටම ෆ්‍රිජ් එකේ ඇති...''
''ඇත්ත නේන්නං...'' අකුරු ඔකකොම ෆ්‍රීස් වෙලා'' පින් මුරගෑවා.


# STANHOPE PRINTING
## FOR OFFSET AND DIGITAL PRINTING

සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

**ALL YOUR PRINTING NEEDS....**

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සදහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243